# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**ක්‍රිස්තු ධර්මය** කාලය පැය එකයි මිනිත්තු තිහයි.

නම / අංකය : ............................................................... **7 ශ්‍රේණිය**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ජල බිංදුවක ක්‍රියාකාරීත්වය තුළ දෙවියන් වහන්සේ අපට පෙන්වා දෙන වටිනාම සත්‍යතාව කුමක් ද?
   i. මැවිල්ල තුළ ජලය අවස්ථා තුනක පවතින බව.
   ii. දේව මැවිල්ල තුළ අඛණ්ඩ ක්‍රියාකාරීත්වයක් ඇති බව.
   iii. වලාකුළුවලින් අපට ජලය ලැබෙන බව.
   iv. මැවිල්ල තුළ ජලය ඉතා පිරිසිදු තත්ත්වයේ පවතින බව.

2. වැය වෙමින් දේව සේවය කිරීමේ වටිනාකම පෙන්වීමට ජේසුස් වහන්සේ භාවිතා කළ සංකේතය වන්නේ,
   i. අන්ධකාරය හා ආලෝකය ii. පහන් හා ආලෝකය
   iii. ලුණු හා ආලෝකය iv. මිදිවතු හා පහන්

3. "උන් වපුරන්නේවත් කපන්නේවත් නැත" යයි ජේසුස් වහන්සේ පැවසුවේ කා ගැන ද?
   i. මිනිසා ගැන ii. සිව්පාවුන් ගැන iii. කුරුල්ලන් ගැන iv. උරගයින් ගැන

4. ස්නාවක ජොහාන් තුමාගේ සේවයට සම්බන්ධ නොවන ප්‍රකාශය කුමක් ද?
   i. නිහතමානී ආදර්ශමත් භාවය
   ii. මනස්ථාපනයෙන් බෞතීස්මයට කැඳවීම
   iii. සේවයට සූදානම හා සරළ දිවි පැවැත්ම
   iv. ශුද්ධාත්මයෙන් හා ගින්නෙන් බෞතීස්ම කිරීම

5. අපට වැරදි කරන අයට කළ යුත්තේ,
   i. සමාව දීම ii. දඬුවම් දීම iii. සුවය දීම iv. බලය දීම

6. ආදම් හා ඒව ජීවත් වූයේ,
   i. ගෙත්සෙමනි උයනේ ii. ජෝර්දාන් තැනිතලාවේ
   iii. පාළුකරයේ iv. ඒදන් උයනේ

7. මෝසෙස් ගේ පවුලේ සිටියේ,
   i. මීරියම් හා ජොශුවා ය. ii. ජොශුවා හා මාර්තා ය.
   iii. මරියා හා ජොහාන් ය. iv. ආරොන් හා මීරියම් ය.

8. ජුදෙව්වන් පිළිකුල් කොට ප්‍රතික්ෂේප කළේ,
   i. පරිසිවරු ii. සමාරිතයන් iii. ලෙවීයන් iv. පූජකයන්

9. දෙවියන් වහන්සේගෙන් දස පනත ලබා ගත් ජන නායකයා,
   i. ආබ්‍රහම්  ii. ඊසාක්  iii. මෝසෙස්  iv. ජාකොබ්

10. දරුවන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් ඇති දුරකථන අංකය,
   i. 1929  ii. 1969  iii. 1990  iv. 1939

(ලකුණු 2 x 10 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු ලියන්න.**

1. කෙටි පිළිතුරු ලියන්න.
   i. ජේසුස් වහන්සේ දරුවන් සම්බන්ධයෙන් කියා ඇති විශේෂ ප්‍රකාශයක් ලියන්න.
   ii. දේව පියාගේ විශ්මිත නිර්මාණවලට උදාහරණ 4 ක් ලියන්න.
   iii. නිහතමානී වීමේ වටිනාකම පෙන්වීමට ජේසුස් වහන්සේ වදාළ උපමාව කුමක් ද? එහි එන ප්‍රධාන චරිත නම් කරන්න.
   iv. දේව මැවිල්ල කෙරෙහි ඔබේ වගකීම් 4 ක් ලියන්න.
   v. පවුලක් ලෙස එකට ජීවත් වීමේ දී අපට ලැබෙන විශේෂ වටිනාකම් 4 ක් ලියන්න.
   vi. ශු. පාවුළු තුමා විසින් ලියන ලද හසුන් 2 ක් ලියන්න.
   vii. ස්නාවක ජොහාන් තුමාට පැවරුණු කාර්යභාරය කුමක් ද?
   viii. ඔබේ ජීවිතයට පැමිණෙන පරීක්ෂාවන් 4 ක් ලියන්න.
   ix. ජේසුස් වහන්සේ ඉගැන්වීම සඳහා තෝරාගත් ස්ථාන 2 ක් ලියන්න.
   x. ජේසුස් වහන්සේගේ ගෝලයන් 4 දෙනෙකුගේ නම් ලියන්න.

(ලකුණු 4 x 10 = 40)

2. i. "කුමක් කමුද කියා ජීවිතය ගැනවත් කුමක් අදිමුද කියා ශරීරය ගැනවත් කරදර නොවන්න" යැයි කීවේ කුමක් නිසා ද? (ල. 04)
   ii. ළමා අයිතීන් ආරක්ෂා කිරීමට දායක වන රාජ්‍ය ආයතන 3 ක් නම් කරන්න. (ල. 06)
   iii. අද සමාජය තුළ දරුවන් මුහුණපාන පීඩාවන් 5 ක් ලියන්න. (ල. 10)

3. i. රන් අණ ලියා දක්වන්න. (ල. 04)
   ii. දේව දරුවෙකු ලෙස අන් අය ඔබට කෙසේ සලකනවාට එබ කැමති ද? කරුණු 06 ක් ලියන්න. (ල. 06)
   iii. ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශනයට සවන් දුන් ජනතාව අතර ඔබත් සිටියේ යැයි සිතා එදින ඔබ ලද පණිවිඩය ගැන විස්තරයක් ලියන්න. (ල. 10)

4. i. 'මනහර දේව නිර්මාණය' ගැන වාක්‍ය 4 ක් ලියන්න. (ල. 04)
   ii. චක්‍රාකාරව සිදුවන දේව නිමවුම්වලට උදාහරණ 3 ක් ලියන්න. (ල. 06)
   iii. මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරය විනාශ වන ආකාර 5 ක් ලියා ඒවා වළක්වා ගත හැකි ආකාර 5 ක් ලියන්න. (ල. 10)